# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2357/45 - 2023 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා - 2023.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනත *(460 වැනි පරිච්ඡේදය)***

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/RM/LND.2/PMLMC.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/9/2015/IR/102.

මොරාණ ජලාශ ව්‍යාපෘතිය යටතේ වම් ඉවුරු ඇළ ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :-

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 10 ඒ, කුඩා ලුණුක ග්‍රාම නිලධාරි වසමේ කුඩාලුණුක ගමේ පිහිටි බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 710021 කලාප අංක 08 පත්‍ර අංක 04 හි දැක්වෙන ඉඩම් කැබලි :

**ඉඩමේ මුළු ප්‍රමාණය හෙක්ටයාර් : 0.4133**

01. **කැබලි අංක : 157**
ඉඩමේ නම : පහල වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකරු: හේරත් මුදියන්සේලාගේ ලීලාවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3025.

02. **කැබලි අංක : 159**
ඉඩමේ නම : පහල වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකරු: හේරත් මුදියන්සේලාගේ කරුණාරත්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1108.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 දෙසැම්බර් මස 29 වැනි දින පෙ. ව. 9.30ට රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023 දෙසැම්බර් මස 22 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**ඩී. ඩී. එස්. තක්ෂිලා ගුණරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
රිදීමාලියද්ද.

2023 නොවැම්බර් මස 02 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11-0094


1A - G 040708 – 14 (2023/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*